**වයඹ පළාත් සභාව - 2018**
**------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

වයඹ පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 21 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, වයඹ පළාත් සාභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

  මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | --------------------------------- |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි 2018 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ | උපලේඛන සමඟ සසඳා නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය තුළදී එක් එක් ප්‍රාග්ධන වැය විෂයන් යටතේ වන සමස්ථ වියදම |

| | | |
|---|---|---|
| වටිනාකම රු.24,662,186,761 ක් ලෙස ගිණුම්ගත කර තිබුණද, දේපල පිරියත හා උපකරණ උපලේඛනය අනුව එම වටිනාකම රු.24,435,110,649 ක් වූයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණ වටිනාකම රු.227,076,112 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | යුතුවේ. | රු.24,662,186,761 ක් ලෙස සටහන් කර ඇත. බොහෝ අවස්ථාවල එක් එක් අමාත්‍යාංශ තමන් යටතේ ඇති දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන වෙන්කර දීමේදී එම ප්‍රාග්ධන වියදම ගිණුම්ගත වීම අදාල, ප්‍රතිපාදන වෙන්කර දී ඇති වැය ශීර්ෂයට සිදුවන අතර වත්කම ගිණුම්ගත වනුයේ වියදම දරනු ලැබූ වැය ශීර්ෂය වෙතටයි. මෙම ක්‍රියාවලිය නිවැරදිව සිදු වීමට නම් ප්‍රතිපාදන වෙන්කළ වැය ශීර්ෂය එම වත්කම නිකුත් කිරීමක් ලෙසත් වියදම සිදු කල වැය ශීර්ෂය වත්කම ලබා ගැනීමක් ලෙසත් සටහන් කළ යුතු වුවද ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු එය නිවැරදිව සිදු කර නොමැති හෙයින් මෙම වෙනස ඇතිවී ඇති බව පෙන්වා දෙන අතර ඉදිරි වර්ෂයේ සිට එම ක්‍රියාවලිය නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.6.2 අනුකූල නොවීම
-------------------

1.6.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2018 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව ප්‍රධාන අමාත්‍යාංශය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු 02 කට අයත් නියාදනය නොකළ තැන්පත් ශේෂ එකතු වටිනාකම රු.153,520,507 ක් විය. | කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳ මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කලයුතුය. | **(i)** ව්‍යාපෘතිවල කටයුතු අවසන් කර නොමැති බැවින් අවසන් තීරණ ලැබෙන තෙක් රඳවාගෙන ඇත.<br><br>(ii) පොදු තැන්පත් ගිණුමේ ඇති කල් ඉකුත් වූ ශේෂ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කරගෙන ඇති අතර දැනටමත් එම ශේෂ නිරවුල් වෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය | | | |
| පළාත් මූල්‍ය රීති 54.6 | කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය වෛද්‍ය ආයතන වල වාහන 16 කට සිදුවූ අනතුරුවලට අදාලව මූලික විමර්ශන පවත්වා වගකිව යුත්තන්ගෙන් එම පාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සිදු වූ විට කඩිනමින් මූලික පරීක්ෂණ පවත්වා පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි. | මෙම වාහන සඳහා මූලික විමර්ශන සිදු කිරීමට අවශ්‍ය නිලධාරීන් පත්කර ඇති අතර එම විමර්ශනවලට අදාල වාර්තා 2019 ජූනි 28 දිනට පෙර ලබා දෙන ලෙසට දැනුවත් කර ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ පළමු වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 1990 ජූනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3 (ආ) වගන්තිය | චක්‍රලේඛයට පටහැනිව සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව 2011 සිට 2017 වර්ෂය දක්වා පරිපාලන වියදම් සඳහා ලැබුණු මුදලින් සියයට 20 ක් සහා අරමුදලට බැර කර ඉතිරි සියයට 80 ක් වන රු. 2,386,681 ක මුදල 2013, 2015 හා 2018 වර්ෂයන්හිදී සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 22 දෙනෙකු අතර ගෙවීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. | ආයතන සංග්‍රහය සහ අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බැවින් අනුමැතියකින් තොරව ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 1990 ජූනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ පිටපතක් ලබා ගෙන අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පිළිතුරු ඉදිරිපත් කරමි. |

2. ආදායම් කළමනාකරණය
----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | -------------------------------- |
| (අ) | පළාත් පාලන ආයතන 31 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රැස්කරන ලද මුද්දර ගාස්තු සහ උසාවි දඩ පිළිවෙලින් රු. 323,229,932 ක් සහ රු. 150,896,239 ක් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් පළාත් පාලන ආයතනවලට ලබාදීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතනවලට හිමිවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ එම ආයතනවලට හැකිතාක් ඉක්මනින් ලබාදීමට කටයුතු කල යුතු වේ. | මෙම මුදල් පළාත් සභාව සක්‍රීය කාලවකවානුව තුලදී අදාල පළාත් පාලන ආයතන විසින් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු පළාත් පාලන ආයතන වෙත ගෙවීම් කරන ලදී. පළාත් සභා නිල කාලසීමාව අවසන් වූ පසු පළාත් පාලන ආයතනවල මුදල් ඉල්ලීම් |

| | | | |
|---|---|---|---|
| | | | ලිපි පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ මත ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මුදල් ගෙවීම් සිදු කරන ලද බව කාරුණිකව සඳහන් කරමි. |
| (ආ) | ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 07 ක් සඳහා අයකර ගත යුතු එකතුව රු.236,210,685 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඇ) | ආදායම් සංකේත 03 කට අදාලව එකතු වටිනාකම රු. 58,171,390 ක් වූ හිඟ ආදායම් 2018 වර්ෂය තුල කපා හැර තිබුණි. | හිඟ ආදායම් කපා හැරීමේදී ආදායම් ඇස්තමේන්තු කිරීම් පිළිබඳව සැලකිල්ලට ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් 2018 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු හිඟ එලදා බදු සහ ඉඩම් බදු මුදල් රු.65,488,945 ක් විය. | හිඟ බදු මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.274,433,543 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,072,313,658 ක් විය.

4. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්
---------------------------------------------------------------------------------------------------

4.1 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්
-----------------------------------

(අ) වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය
------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2003 අංක 04 දරන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 04 (2) වගන්තිය ප්‍රකාරව වයඹ පළාත තුළ පිහිටුවා තිබූ රජයේ | පූර්ව ළමා අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ සියළු පෙර පාසල් ලියාපදිංචි කර ගැනීමට සහ ප්‍රඥප්ති විධිවිධාන වලට | 2018 මැයි මස ආරම්භ කරන ලද තාවකාලික ලියාපදිංචිය ලබාදීමේ වැඩසටහන අනුව සියළුම පෙර පාසල් ABCD වර්ගීකරණයට |

| | | |
|---|---|---|
| හා පෞද්ගලික පෙර පාසල් 2,238 කින් පෙර පාසල් 903 ක් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබූ අතර, එයින් පාසල් 720 ක් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ පැවතුනි. | අනුකූලව කටයුතු කල යුතුවේ. | අනුව 2020 මැයි 31 දිනට පෙර ලියාපදිංචි කිරීමට කටයුතු කර ඇත. |

(ආ) වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය

-------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ----------------------------------- |
| (i) | කුරුණෑගල ඩී.බී. වෙලගෙදර ආයුර්වේද රෝහල් පරිශ්‍රයේ තිබූ සඳුන් ගසක් 2013 අප්‍රේල් 14 දින සොරෙන් කැපීම සම්බන්ධව මානව සම්පත් සංවර්ධන අධිකාරිය විසින් සේවයේ යෙදවූ ආරක්ෂක නිලධාරියාගෙන් එම වටිනාකම අයකර මුදල් පියවීමට කටයුතු නොකර අධිකාරිය විසින් රු. 352,000 ක මුදලක් ආයුර්වේද රෝහලට 2018 අගෝස්තු 21 දින ගෙවීමට කටයුතු කර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන්ගෙන් සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | එදින සේවයේ යෙදී සිටි ආරක්ෂක නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීම සිදුකල නොහැකි බැවින් ප්‍රධාන ලේකම්ගේ උපදෙස් පරිදි මෙම මුදල ගෙවීමට සිදුවී තිබුණි. |
| (ii) | මානව සම්පත් සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන චක්‍රීය ණය වලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයකර නොගත් වර්ෂ 07 කට වඩා වැඩි ණය වාරික හා පොලිය රු. 10,194,983 ක් විය. | හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ. | මෙහි ආයතනය ලබාදෙන ණය මුදල්වලට අදාල හිඟ ණය ශේෂ පවතින අතර, ආර්ථික දුෂ්කරතා මත වාරික හිඟයක් පැවතියද කොටසින් කොටස ණය අයකර ගැනීමට කටයුතු කරනු ලබයි. |

(ඇ) වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ------------- | -------------------------------------- |
| හෙරලියාවල කර්මාන්තපුරයේ මුල් පියවරට අදාල අක්කර 12 රූඩ් 03 න් අක්කර 5.74 ක් ආයතන 04 ක් වෙත සින්නක්කරව විකුණා තිබූ අතර, ඉතිරි කොටසේ අයිතිය ආයෝජන මණ්ඩලය සතුව පැවතුණි. මෙම බිම් කොටස් කර්මාන්ත සේවා කාර්යාංශයට පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | රජයේ ඉඩම් සින්නක්කර විකිණීම සම්බන්ධව විධිමත් සනාථ කිරීම් සහ කර්මාන්තපුරයේ ඉතිරි ඉඩම් පිළිබඳ කාර්යංශයට ඇති අයිතිය පිළිබඳ විධිමත් සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුවේ. | කර්මාන්තපුරයේ අක්. 12 රූඩ් 03 හිමිකාරිත්වය මේ දක්වා කාර්යාංශය සතුව පවතී. පළාත් සභාව සතු ඉඩම් බලතල සීමිත හෙයින් ඉඩම සෘජුවම පවරා ගැනීම අපහසු වී ඇත. ගිවිසුම් අත්සන් කිරීම ආයෝජන මණ්ඩලය කරනු ලබන්නේ ව්‍යාපාරිකයන්ට බැංකු ණය ආදිය ලබා ගැනීමට එමඟින් හැකියාව ඇති නිසාය. අක්කර 5.74 ක් ආයතන 04 ක් සමඟ ඇති කරගත් ගිවිසුම මත සින්නක්කර අලෙවි කර ඇත. |

(ඇ) වයඹ සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැතියන් 11 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.11,089,042 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයගැතියන්ගෙන් අයවිය යුතු සියළු මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අයකරගත යුතු රු.11,089,042 ක මුදලින් අයකර ගැනීමට හැකියාව පවතින මුදල අයකර ගැනීමටත් ඉතිරි මුදල් සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කිරීමෙන් පසුව අවශ්‍ය ඉදිරි පියවර ගැනීමටත් කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියන් 08 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.9,320,083 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සියළු ණයහිමි ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | ණය හිමියන් 27 දෙනෙකු සඳහා රු.2,649,404 ක මුදලක් මේ වන විට සම්පූර්ණයෙන් ගෙවා ඇති අතර, ඉතිරි ගෙවීම් කොටස් වශයෙන් සිදුකර ඇත. ඉතිරි රු.9,320,083 ක මුදල තුල දැනට වැඩ නිමකර ඇති පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අවිච්ඡේද වැඩ විෂයන් සඳහා වූ මුදල්ද ඇත.<br>එම මුදල් ලැබුණු පසු මෙම සියළුම ගෙවීම් අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලසුම්කරණයක් නොමැතිව රු.12,618,363 ක වියදමක් දරා නිම කරන ලද මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය වසර දෙකකට නොවැඩි කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු හැකි ඉක්මණින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. | මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය බදුගෙන ඇති ආයෝජකයා විසින් එහි දැනට ඉතිරිව ඇති ඉදිකිරීම් සියල්ල සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට එකඟතාවය පලකර ඇත. |
| (iv) | රු.3,000,000 ක් වැයකර ස්ථාපිත කර තිබූ පරිගණක උපකරණ සහිත පරිගණක විද්‍යාගාරය නිශ්ක්‍රීයව පැවතුණි. | අධිකාරිය විසින් පුහුණු වැඩ සටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | හෝටල් පාසලේ සිසුන් පරිගණක පාඨමාලා සඳහා සහභාගී කරවනු ලැබේ. පරිගණක විද්‍යාගාරය දැනට නිශ්ක්‍රීයව පවතී. |

(ඉ) සමූපකාර සංවර්ධන අරමුදල

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i). | සමූපකාර සමිති 64 ක් විසින් ලබාදුන් ණය මුදල් රු. 68,971,575 ක් කල් පසුවී | ණය අයකර ගැනීමට විධිමත් | කල් පසු වූ ණය ක්‍රියාකාරී සමිති, අක්‍රිය සමිති හා ඈවර සමිති ලෙස කණ්ඩනය |

| | | | |
|---|---|---|---|
| | තිබූ අතර එම ණය මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුවේ. | කර ඇත. මෙහි ක්‍රියාකාරී සමිති දැනුවත් කිරීමට කටයුතු කළ අතර අක්‍රිය ඈවර සමිති ව්‍යවස්ථාපිත කටයුතු සිදු කරමින් පවතී. එම කටයුතු නිම වීමෙන් අනතුරුව ණය ශේෂය අයකර ගැනීම සිදු කෙරේ. |
| (ii). | 2018 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් සමූපකාර සමිතිවලින් අරමුදලට ලැබිය යුතු රු. 100,209,014 ක දායක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමිති දායක මුදල් නිසි පරිදි සමූපකාර අරමුදලට අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සියළුම විවිධ සේවා සමූපකාර සමිති සඳහා ව්‍යවස්ථාපිත අනුමැතීන් ලබාදීමට පෙර සමූපකාර සංවර්ධන අරමුදල් දායකය අයකර ගැනීමට කටයුතු කරන අතර මීට අමතරව රීති සංශෝධනය කිරීමේදී අරමුදල් දායකය ගෙවීමට සමිති උනන්දු කරවීමට කටයුතු යොදා ඇත. |
| (iii). | තීරක ගිණුමේ රු.10,500,000 ක ස්ථාවර තැන්පතු ශේෂයක් දක්නට ඇතත් මෙම මුදල් අදාල සමූපකාර සමිතිවලට නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. | තීරක ගිණුමේ මුදල් අදාල සමිතිවලට නිදහස් කිරීමට කටයුතු කළ යුතුවේ. | තීරක ජංගම ගිණුමේ පවතින අතිරික්ත මුදල් සහ ස්ථාවර තැන්පතු සඳහා ලද පොළී රු.10,500,000 ක් ස්ථාවර තැන්පත් වශයෙන් කුලියාපිටිය මහජන බැංකුවේ ආයෝජනය කර ඇත.<br>මෙම මුදල් සමිති වෙත නිදහස් කිරීමක් සිදු නොකරන අතර ඉදිරියේදී සමූපකාර අරමුදලට බැර කිරීමට කටයුතු කර ඇත. |

(ඊ) වයඹ ජනකලා පදනම

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකාර අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් හා පරිපාලන නිලධාරි තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ නොකර පූර්ණ කාලීන වැඩ බැලීමේ පදනම මත පත්වීම් ලබාදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 1,248,912 ක එකතු වැටුපක් ගෙවා තිබුණි. | පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර නිලධාරින් පත් කිරීම කළ යුතුවේ. | වයඹ ජනකලා පදනමේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව, සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් පවතී. පදනමේ ප්‍රඥප්ති අරමුණු ඉටු කිරීම සඳහා ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටි ප්‍රකාරව 2013-12-04 වන දින සිට 2016-12-03 දක්වා වසර 03 ක කාලයකට පාලන හා සංස්කෘතික තනතුරට ජේ.ඒ.ජගත් කුමාර මහතා පත් කර ඇත. මොහු සෞන්දර්ය විෂය පිළිබඳ දැනුමක් ඇති නිලධාරියෙකු වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017-12-3 දින සිට සහකාර අධ්‍යක්ෂ (සංස්කෘතික) තනතුර සඳහා බඳවා ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ඔහුට රු.454,908 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා ඇත.<br>සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා ඉහතින් ඉවත් කරන ලද පාලන තනතුරට අදාල රාජකාරි පවරා ඇත. උක්ත තනතුර සඳහා සේවා පළපුරුද්ද සමඟ ව්‍යාපාර පරිපාලන (විද්‍යාවේදී) උපාධිධාරි ඩී.එම්.ටී.කේ.දිසානායක මහතා පත් කොට |

| | | |
|---|---|---|
| | | ඇත. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය හා පාලන) තනතුර එකක් ලෙස සලකා එක් වැඩ බැලීමේ දීමනාවක් ගෙවනු ලැබේ. |

(උ) වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුලී ගාස්තු, වාහන අළුත්වැඩියා ගාස්තු , සේවා මධ්‍යස්ථාන ගාස්තු හා සිවිල් වැඩ ගාස්තු ලෙස ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.72,303,791 ක් වූ අතර, එම ශේෂය තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් වීමකින් තොරව පවතින ණය ශේෂවල වටිනාකම රු.18,120,261 ක් වී තිබුණි. සියළුම ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලීන හිඟ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

(ඌ) වයඹ නිවාස හා ඉදිකිරීම් සංවර්ධන අරමුදල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු. 8,775,912 ක් වූ අතිරික්තය තුළ අරමුදලේ කාර්යභාරය ඉටු කිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් දෙපාර්තමේන්තුවෙන් දෙනු ලැබූ රු. 6,000,000 ක් සහ සමූපකාර පදනමින් දෙනු ලැබූ රු. 1,000,000 ක් ඇතුලත් වී ඇතත් මෙම මුදල් අරමුදලේ අරමුණුවලට අදාල කිසිදු ව්‍යාපෘතියක් සඳහා යොදවා නොතිබුණි. | ලැබෙන ප්‍රතිපාදන අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුවේ. | නිවාස හා ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ක්‍රියාකාරකම් සැලසුම් කළද අපගේ පාලනයෙන් බැහැරව පැන නැගුනු කරුණු හේතුවෙන් විගණනය විසින් පෙන්වාදී ඇති තත්ත්වයන් පැන නැගී ඇත. |

(එ) වයඹ ප්‍රධාන අමාත්‍ය අරමුදල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වයඹ පළාත් සභාවේ 1990 අංක 02 දරන වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ප්‍රඥප්තියේ අංක 6 ජේදය ප්‍රකාරව අරමුදලේ මුදල්, වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම සඳහා හෝ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා හෝ ආගම නංවාලිම සඳහා හෝ ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන යාම | ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ප්‍රඥප්තිය අනුව අරමුදලේ අරමුණු විගණනයේ සඳහන් කර ඇති නිර්ණායකයන්ට තිබෙන බව සඳහන් කරමි. එසේ වුවද ක්‍රීඩා හා වෙනත් මහජන සුභ සාධන ආධාර සමාජ සුභ සාධන හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබයි. බරපතල ගණයේ සැත්කම් හා බෝ නොවන රෝග සඳහා පිළියම් යෙදීමේදී මුදල් ඌණතාවයෙන් |

| | | |
|---|---|---|
| සඳහා හෝ යෙදවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ දී ඒ සඳහා කිසිදු මුදලක් ප්‍රධාන අමාත්‍ය අරමුදලින් දරා නොතිබුණි. | | පෙළෙන ජනතාව සඳහා පළාත් සභා මට්ටමින් සහනයක් සැලසීමට ඇති එකම අරමුදල ප්‍රධාන අමාත්‍ය අරමුදල වේ. |

(ඒ) වයඹ පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ගනුදෙනු ඇතුළු විස්තර පරිගණකගත කිරීම සඳහා වැඩසටහනක් පිළියෙල කිරීමට 2010 වර්ෂයේදී වයඹ පුහුණු ආයතනය සමග රු.672,000 ක් වූ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා අත්තිකාරම් වශයෙන් රු. 168,000 ක් 2010 වර්ෂයේදී ගෙවා තිබුණද, 2018 වර්ෂය අවසන් වන විටත් මෙම වැඩසටහන පිළියෙල කර නොතිබුණු අතර ගෙවූ අත්තිකාරම් මුදල ද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල පරිගණක වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරිගණක වැඩසටහන සඳහා දායකයින්ගේ මූලික තොරතුරු ඇතුලත් කර අවසන් කර ඇති අතර 2019 වර්ෂයේදී දායක මුදල් ලැබීම් සඳහා වන තොරතුරු ඇතුලත් කරමින් පවතී. 2019 වර්ෂය අවසන් වන විට දත්ත ඇතුලත් කිරීමේ කටයුතු අවසන් කර 2020 ජනවාරි සිට වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සූදානම් කර ඇත. |

4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

-----------------------------

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ අමුද්‍රව්‍ය සැපයීම ඇතුළුව කාර්මික වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.22,873,011 ක් වූ අතර ඉන් රු.8,689,094 ක් වසර 7 -18 දක්වා අතර කාලයකට අදාළ විය. මෙම සියළු ණයගැති ශේෂයන් මෙතෙක් අය නොවී පැවතුණි. | මෙම ණය ශේෂ ඉක්මනින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර දිර්ඝ කාලීනව අය නොවී ඇති රු.8,619,878 ක ශේෂ සම්බන්ධයෙන් පළාත් භාණ්ඩාගාර උපදෙස් ලබාගත යුතුවේ. | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව, කුරුණෑගල යන නමින් ඇති රු.69,216 ක් වූ ණය ශේෂය හඳුනාගෙන එය අවසන් කිරීමට 2019 ගිණුම මඟින් සිදු කරන බව දක්වා ඇත. |

5. මෙහෙයුම් සමාලෝචනය

5.1 කාර්යසාධනය

5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සහා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 2,345.20 | 2,324.85 | 20.35 |
| (ආ) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 258.00 | 256.18 | 1.82 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 75.46 | 75.46 | - |
| (ඈ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 324.80 | 250.33 | 74.47 |
| | | 3,003.46 | 2,906.82 | 96.64 |

5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තැලසීමියා ඒකකයට ප්‍රතිකාර සඳහා යොමුවන රෝගීන් සංඛ්‍යාව වසරකට 950 කට ආසන්න සංඛ්‍යාවක් බව පවසා එම රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ Vein Viewer ස්කෑන් යන්ත්‍රයක් මිලදී ගැනීමට 2017 වර්ෂයේ යෝජනා කර තිබුණද එම යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මිලදීගෙන නොතිබූ අතර තැලසීමියා අරමුදලේ රු.1,945,758 ක මුදලක් වසර ගණනාවක සිට මේ දක්වාම කිසිදු කාර්යයකට නොයෙදවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | යන්ත්‍රය නොපමාව මිලදීගෙන තැලිසීමියා රෝගීන්ට සේවා සැලසීමේ කටයුතු සිදු කළ යුතුවේ. | මෙම මුදල ප්‍රයෝජනයට ගනිමින් වයඹ පළාත් තැලසීමියා නිවාරණය සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලිපි යොමුකර ඇත. 2019 ජූනි 11 දින පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අතර එම වාර්තා ලබා ගැනීමෙන් පසු එම මුදල තැලසීමියා රෝග නිවාරණය සඳහා වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත නිදහස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු වයඹ පළාත් රණවිරු ස්මාරකය ඉදිකිරීම වෙනුවෙන් රු. | වියදම් දැරීමේදී ආර්ථිකභාවය සහ ඵලදායිතාවය පිළිබඳව | මෙම උත්සවයට අදාල වියදම් දැරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | 18,697,553 ක මුදලක් වැය කර තිබුණු අතර, 2018 මැයි 11 දින පැවති විවෘත කිරීම වෙනුවෙන් උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ රු. 7,088,328 ක මුදලක් වැය කර තිබුණි. රණවිරු ස්මාරකය විවෘත කිරීම සඳහා වැය කළ මුදල එය ඉදිකිරීම සඳහා වැය කළ වියදමෙන් සියයට 38 ක් විය. | අවධානය යොමු කිරීමට වගකිව යුතු නිලධාරීන් සැලකිලිමත් විය යුතුවේ. | |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් සියළුම සෞඛ්‍ය වෛද්‍ය ආයතන වෙත ඖෂධ සැපයීම සිදු කරනු ලබන ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ තැන්පත් කරන ඖෂධවල ගුණත්වය ආරක්ෂාවීම සඳහා සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර 09 න් 08 ක්ම ක්‍රියා විරහිතව පැවතුණි. | ඖෂධවල ගුණත්වය ආරක්ෂා වන පරිදි සම්පූර්ණ ඖෂධ ගබඩාවම වායු සමනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන ඖෂධ ගබඩාවේ අක්‍රිය වී තිබූ වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් 2018 වර්ෂයේදී අපහරණය කිරීමට නිර්දේශිත වාහන 14 ක් කාර්යාල භූමියේ රඳවා ඇති අතර ස්වභාවික හේතූන් මත ඒවා දිරාපත්වීමට ලක්වෙමින් පැවතුණි. | මෙම වාහන කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුයි. | 2015 වර්ෂයේ සිට භාවිතා නොකරන අපහරණය සඳහා හඳුනාගත් වාහන 14 ක තොරතුරු අවස්ථා දෙකකදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමුකර ඇත. |
| (ඉ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී මදුරු කීට උගුල් 1,650 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 825,000 ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු මදුරු ගහනය අවම කිරීමේ විශේෂ පරීක්ෂණ ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බැවින් ඒ සඳහා වැය කරන ලද මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | සහයෝගය මත තාක්ෂණික දෝෂයන් නිවැරදි කර ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය පර්යේෂණ ව්‍යාපෘතියක් වන අතර එහිදී හඳුනා ගන්නා ලද මදුරු කීට උගුලේ තාක්ෂණික දෝෂයන් නිවැරදි කර නැවත ක්‍රියාත්මක කිරීමට සුදුසු තත්ත්වයේ පවතීද යන්න පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය මත ඉදිරියේදී නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |
| (ඊ) | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල් හා බෙහෙත් ශාලා පවත්වාගෙන යනු ලබන ඉඩම් 33 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරාගැනීම් කටයුතු කඩිනම් කළ යුතුවේ. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා පිහිටි ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. |
| (උ) | පළාත් සභාවේ අමාත්‍යාංශ, ප්‍රධාන ලේකම් කාර්යාලය, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන | 2014 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව ණය ශේෂයන් | ස්ථාන මාරු වී පැමිණි හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ මාස තුනක් ඇතුලත නිරවුල් කල යුතු බව පිළිගනිමි. එසේ වුවද යම් විශේෂ |

| | | | |
|---|---|---|---|
| | 26 ක ස්ථාන මාරු වී ගිය, මිය ගිය, සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ වෙනත් හේතු මත නිරවුල් නොකළ සේවක ණය ශේෂවල එකතුව රු.44,311,446 ක් විය. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හේතු මත හා ඉතා දීර්ඝ කාලයක සිට පැවතුන යම් ණය ශේෂ අය කර ගැනීමට අදාල වන්නා වූ තොරතුරු නොමැති වීම නිසා යම් යම් ණය ශේෂයන් මෙතෙක් නිරවුල් කර ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමි. අයකර ගැනීම සඳහා කිහිප වාරයකදී ලිපි යොමුකර ඇති නමුත් ණය ශේෂයන් නොසැසඳීම වැනි විවිධ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් අයකර ගැනීමට අපහසු වී ඇත. |
| (ඌ) | පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන 08 කට ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගේ රු.25,092,756 ක් වූ ණය ශේෂ එකතුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2014 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ණය ශේෂ නිරවුල් කිරීම සඳහා අදාල ආයතන වෙත ණය ශේෂයන් තහවුරු කර ගැනීමට ලිපි යොමු කර ඇත. ණය ශේෂ නොසැසඳීම නිරවුල් කිරීමේ දී ගැටළුවක්ව පවතින අතර එය නිවැරදි කර ගෙන ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (එ) | මුන්දලම දිසා රෝහලේ ඖෂධ ගබඩාවේ රු.810,169ක් වටිනා ඖෂධවල ඌනතාවයක් හා රු.19,943ක් වටිනා ඖෂධවල අතිරික්තයක් පවතින බව 2018 ජුලි 02 දිනැති සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් අනාවරණය කර තිබුණි. | මෙම ඖෂධ ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඒ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා තොරතුරු තාක්ෂණික පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.7,500,000 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් එම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට රු.1,500,000 ක උපදේශන ගාස්තු සඳහා පමණක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කොට එහි ප්‍රගතිය ඇගයීමට හා උපදේශන වාර්තාවට අනුව ව්‍යාපෘතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා සාමූහිකව ගත් තීරණයක් අනුව 2018 වර්ෂයේ මුදල් කොමිෂන් සභාව දැනුවත් කර මීට අදාල ප්‍රතිපාදන වෙන්කර ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ගිවිසුමට අනුව මෙම මොඩියුලය සකස් කොට අධිකාරියට ලබාදී ඇති බැවින් එය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න විමසීම ඔවුන්ගෙන් කළයුතු බැවින් ඒ සඳහා ලිපියක් අධිකාරියට යවා ඇත. |
| (ඔ) | මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ පුහුණු වැඩමුළු දෙකක් පවත්වා තිබූ අතර, ඒ සඳහා | සමස්ථ අරමුණු ඉටුවන ආකාරයට පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | 690 ක් පමණ වන අමාත්‍යාංශයේ හා අදාල සියළු දෙපාර්තමේන්තුවල නිලධාරීන් සම්බන්ධ කරගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු කටයුත්තක් වුවත්, හැකි සෑමවිටම අමාත්‍යාංශයට මුල් තැන දෙමින් සියළු දෙනාම සහභාගි කරවීමට කටයුතු කරමි. |

රු.468,725 ක් වැයකර තිබුණි. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල නිලධාරීන් 690 ක් පමණ සිටියද ඒ සඳහා සහභාගිවී තිබුණේ එක් වැඩමුළුවකට 52 ක් හා අනෙක් වැඩමුළුවට 61 දෙනෙකු පමණි.

5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාදම්පේ ආයුර්වේද රෝහලේ රෝගී සත්කාරය සඳහා නිතර අවශ්‍යවන ඖෂධ වර්ග 14 ක් මාස 01 සිට මාස 192 ක කාලයක් හිඟව පැවතුණ අතර බාහිර රෝගීන් සඳහා නිකුත් කිරීමට අවශ්‍යවන ඖෂධ වර්ග 24 ක් ඖෂධාලයේ නොමැති වීම නිසා එම ඖෂධ රෝගීන් හට පෞද්ගලික ආයතනවලින් මිලදී ගැනීමට සිදුව තිබුණි. | රෝගීන් සඳහා නිතර අවශ්‍යවන ඖෂධ වර්ග හිඟතාවයකින් තොරව ලබාදීමට කටයුතු සලසා දිය යුතුවේ. | ඇතැම් ඖෂධ වර්ග ඖෂධ සංස්ථාවෙන් ඉල්ලුම් කළද, එම ඖෂධ අප වෙත ලැබීමේදී යම් සැලකිය යුතු කාලසීමාවක් ගතවීමත්, ඉල්ලන ප්‍රමාණයන්ගෙන්ම එම ඖෂධ වර්ග අප වෙත නොලැබීමත්, පවතින සීමාසහිත ප්‍රතිපාදන ප්‍රමාණය මත ඖෂධ මිලදී ගැනීමට සිදුවීමත් යන කරුණු හේතුවෙන් සියළු ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලාවන්හි ඖෂධ අවශ්‍යතාවයන් ඒ අයුරින්ම සම්පූර්ණ කළ නොහැකිවන අවස්ථාවන් පවතී. එතෙක් මෙම ආයුර්වේද රෝහල් පැවති ඖෂධ වර්ගවලින් ආදේශක ලෙස යොදාගත හැකි ඖෂධ වර්ගයන් යොදාගෙන රෝගී සත්කාරක කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සිදුකරන ලදී.<br>ජයතිලක රසය සහ දිව්‍යාංගනාදී තෛලය වර්තමානයේ දී භාවිතා නොකරන බවද දන්වා සිටිමි. |
| (ආ) | මුන්දලම දිසා රෝහලේ කල් ඉකුත් වූ ඖෂධ වර්ග 88ක තොග 2018 වර්ෂයේ පොත්වලින් ලියා අස්කර තිබුණු අතර එම ඖෂධ අතරින් මිල ගණන් ඉදිරිපත් කළ ඖෂධ වර්ග 49ක තොගයේ වටිනාකම රු.634,213ක් විය. කල් ඉකුත් වීමට පෙර එම ඖෂධ අවශ්‍යතාවය ඇති වෙනත් රෝහල් වෙත ලබාදී නාස්තිය අවම කර ගැනීමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියා කර නොතිබුණි. | කල් ඉකුත් වීමට පෙර එම ඖෂධ අවශ්‍යතාවය ඇති වෙනත් රෝහල් වෙත ලබාදී නාස්තිය අවම කර ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන | ඖෂධ කල් ඉකුත්වීමට පෙර අවශ්‍යතාවය ඇති | ඉදිරියේදී ඖෂධ කල් ඉකුත්වීම වළක්වා ගැනීමට කටයුතු කිරීමට ඖෂධවේදී |

| | | | |
|---|---|---|---|
| | 48 ක 2018 දෙසැම්බර් 31 දිනය වන විට රු.9,694,079 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ ඒකක 439 ක් හා රු.2,600,204 ක් වටිනා තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 124 ක් පැවතුණි. | වෙනත් රෝහල්වලට ලබාදීමට හා විධිමත් තොග පාලන ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුයි. | නිලධාරිනිය දැනුවත් කර ඇති අතර කල් ඉකුත්වූ ඖෂධ මූලික රෝහල් ඇතුළුව ආයතන කිහිපයක අපහරණය කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ගැබිණි එළදෙනුන් සුලභ කිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 7.6 ක් ලබාදී තිබූ අතර, 2018 වර්ෂය වන විට රු.6,607,430 ක වියදමක් දරා තිබුණි. සැලසුම් කළ පරිදි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගවගාල් ඉදිකර නොතිබූ අතර අලෙවි කිරීම සඳහා එක් සතෙකු හෝ සූදානම් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිසි පරිදි සැළසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘතිය අනුව සතුන් මිලදී ගෙන රඳවා තබා නඩත්තු කිරීමට ස්ථානයක් ගොවිපොලේ නොමැති වීම නිසා ස්ථානයක් සකස් කරන තුරු වැස්සි පැටවුන් මිලදී ගැනීම 2017 වර්ෂය අවසානය දක්වා කල් දැමීමට සිදු විය. ගවගාල් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට වැඩි කාලයක් ගතවීම නිසා සතුන් මිලදී ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමි. |
| (ඉ) | 2017 වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාන කිරි ගොවිපල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.8,906,482 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, රු.8,374,882 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ සියයට 50 ක රජයේ දායකත්ව මුදල් රු.2,631,935 ක් ලබාදුන් ප්‍රතිලාභීන් 55 ක් සම්බන්ධයෙන් භෞතිකව පරීක්ෂාවේදී කිරි නිෂ්පාදනය වැඩි වී නොතිබුණු අතර තරුණ ගොවීන් කිරිගව පාලනය සඳහා යොමුවී නොතිබුණි. එසේම කිරි දෙවීමේ යන්ත්‍ර හා ගව ගාල් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණද භෞතිකව පරීක්ෂා කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 ක ප්‍රතිලාභීන් 08 දෙනෙකු වෙත ලබාදී තිබූ රජයේ ප්‍රතිපාදන මත මිලටගත් රු.417,500 ක් වටිනා කිරි දෙවීමේ යන්ත්‍ර 05 ක් හා ඉදිකර තිබූ ගවගාල් 03 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ලබාදුන් උපකරණ හා ගව ගාල් කඩිනමින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පුද්ගලික ප්‍රශ්න, අසනීප තත්ත්වයන්, සතුන් කිරි වැරීම හා ගැබ් ගැනීම වැනි හේතු නිසා උපකරණ හා ගව ගාල් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී ඇත. |
| (ඊ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වයඹ පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට “නිවහන” නිවාස ආධාර ලබාදීම සඳහා රු.3,000,000 ක ප්‍රතිපාදන මගින් එක් අයකුට රු.40,000 බැගින් 75 දෙනකුට ලබාදීමට සැලසුම් කර | ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීම සඳහා යම් වැඩ කොටසක් නිමකර ගැනීමට ප්‍රමාණවත් ආධාර මුදලක් ලබාදිය යුතුවේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලබන්නේ අනුමත කර දෙනු ලබන ප්‍රතිපාදන පදනම් කරගෙන වේ. අපේක්ෂිත පරිදි නිසි කලට අක් මුදල් නොලැබීම හා පළමු අදියර ආධාර ලබාගත් ප්‍රතිලාභීන් විසින් තම ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය අපවෙත ඉදිරිපත් |

| | | | |
|---|---|---|---|
| | තිබුණද පදනමකින් තොරව ආධාරලාභීන් 138 ක් තෝරාගැනීම නිසා එක් අයෙකුට ලබාදියයුතු සම්පූර්ණ ආධාර මුදල ලබාදීමට නොහැකිවී තිබුණි. ඉන් ආධාරලාභීන් 16 දෙනෙකු හැර ඉතිරි සියලු දෙනාටම ලබාදිය හැකිවී තිබුණේ ආධාර මුදලින් කොටසක් පමණි. | | කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් සහ ඉල්ලුම්පත් සමඟ සම්පූර්ණ කළයුතු අවශ්‍යතා හා නිර්ණායක සපුරා තිබූ අයවලුන් වැඩි පිරිසකට ප්‍රතිලාභ සැලසීමට සිදුවීම හේතුවෙන් විගණනය විසින් පෙන්වාදී ඇති තත්ත්වය පැන නැගී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (උ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාප්තව පවතින වකුගඩු රෝග නිවාරණ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම කෙරෙහි, අවදානම් කලාපවල පවතින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල ප්‍රමාණවත් රසායන පහසුකම් නොමැතිවීම, වකුගඩු රෝග නිවාරණ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම හා ලබාදෙන ප්‍රතිපාදන වර්ෂය මුල නොලැබීම, දිස්ත්‍රික්කයේ පවතින පාසල්වල පිරිසිදු පානීය ජල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම හා වකුගඩු රෝගීන් බහුලව සිටින පොල්පිතිගම දිසා රෝහලේ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම යන හේතු බලපා තිබුණි. | අවදානම් කලාපවල ඇති සෞඛ්‍ය වෛද්‍ය ආයතනවල මානව සම්පත් හා යටිතල පහසුකම් වැඩිදියුණු කරදීමට කඩිනමින් කටයුතු කළයුතුයි. | උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික වකුගඩු රෝග නිවාරණ ඒකකයෙන් 2018 හා 2019 වර්ෂවලදී ඉල්ලීම් කර ඇත. |
| (ඌ) | 2017 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා හලාවත අධ්‍යාපන කලාපයට අයත් පාසල්වලින් පෙනී සිටි සිසුන් 3664ක ගෙන් සිසුන් 1178ක් අසමත් වී තිබුණි. හලාවත අධ්‍යාපන කලාපයේ 2017 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගේ සමස්ත අසමත්වීමේ ප්‍රතිශතය සියයට 35ක් වූ අතර ආරච්චිකට්ටුව කොට්ඨාශයේ අසමත්වීමේ ප්‍රතිශතය සියයට 50කට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි. | අසමත්වීමේ ප්‍රතිශතය අවම කර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2016 වර්ෂයේ අසමත්වීමේ ප්‍රතිශතය සියයට 39ක් වන අතර 2017 වර්ෂයේ අසමත්වීම සියයට 7ක් අඩුවී ඇත. |

5.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ / නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිවාස හා ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් රිදීගම කොටුහේන | ප්‍රතිපාදන වෙන්කරදීමෙන් පසු සැලසුම්වලට අනුකූලව අදාල සංවර්ධන | පිළිගනිමි. |

| | |
|---|---|
| ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා රු.2,495,396 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. 2019 ජනවාරි වන විට මුළු වැඩ වලින් සියයට 19 ක ප්‍රමාණයක් පමණක් නිමකර මෙම ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | ව්‍යාපෘති වැඩ නිමකර මහජනතාවගේ ප්‍රයෝජනයට ලබාදිය යුතුවේ. |

5.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

5.5.1 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ව්‍යාපෘති වාර්තාව අනුව බොජුන්හල් වෙනුවෙන් යෝග්‍ය ස්ථානයක් ලබාගැනීම හා එය වසර 05 ක් සඳහා නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සිදුකළයුතු වුවද. පරීක්ෂා කරන ලද හෙළ බොජුන්හල් 09 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමක් සිදුවී නොතිබුණි. | අදාල ඉඩම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | හෙළ බොජුන්හල් පවත්වාගෙන යන රජයේ ඉඩම්වල අයිතිය පවරා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. |

5.6 වත්කම් කළමනාකරණය

5.6.1 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකවලට අයත් නිල නිවාස 38 ක් නිශ්ක්‍රීයව තිබුණි. | අභාවිතව පවතින නිලනිවාස අළුත්වැඩියා කර නිලධාරීන් පදිංචි කිරීමට කටයුතු කළ යුතුයි. | මෙම නිල නිවාස ලැබෙන ප්‍රතිපාදන අනුව හා ප්‍රමුඛතාවය මත අළුත්වැඩියා කිරීමට සැලසුම් කර ඇත. |
| (ආ) | 2014 වර්ෂයේදී රු.5,000,000ක් වැයකර කරුවලගස්වැව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබුණු නීලබැම්ම නිවාඩු නිකේතනය ඉදිකළ වර්ෂයේ සිටම නිශ්කාර්යව පැවතුණු අතර 2014 වර්ෂයේ රු.10,000,000ක් සහ රු.3,000,000ක් වැයකර ඉදිකර තිබුණු සතිපොළ ගොඩනැගිලි වසර 01ත් 02ත් අතර කාලයක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි. | සති පොල ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | නීලබැම්ම නිවාඩු නිකේතනය බදු දීමට කටයුතු කරමින් පවතින අතර හා එම ස්ථානයේ සති පොල සඳහා වෙළෙඳුන් සහ මහජනයා නොපැමිණෙන බැවින් එසේ පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ජනසළු මධ්‍යස්ථානයන්හි භාවිතයට නොගන්නා විවිධ මානයන්ගෙන් යුත් රු.1,139,607 ක වටිනා නූල් තොග පැවතුණි. | අනවශ්‍ය පරිදි තොග රැස්කල නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | දහම් පාසල් සාරි නිෂ්පාදනය සඳහා මෙම නූල් තොග ලබාගත්තද, අදාල ඇණවුම් පසු කාලීනව නොලැබීම මත මෙම නූල් ඉතිරි වී ඇත. |
| (ඇ) | වාරියපොල රජයේ ගොවිපල පරිශ්‍රයේ 2016 වර්ෂයේ රු.808,830 ක් වැයකර හෙළ බොජුන්හල් ගොඩනැගිල්ලක් ස්ථාපිත කර විදුලිය හා රු.796,112 ක් වටිනා උපකරණ ලබාදී තිබුණද 2018 නොවැම්බර් වන විට එය වසා තිබුණි. | නිශ්කාර්යව පවතින වත්කම් ආර්ථික සංවර්ධනයට දායක වන අයුරින් ප්‍රයෝජනයට ගත යුතුවේ. | මෙමඟින් අපේක්ෂිත ආදායම නොලැබීම හා එහි නඩත්තු වියදම් වැඩිවීම නිසා මෙම බොජුන්හල වැසී ඇත. මෙම ගොඩනැගිල්ල ගලවා ඉවත්කළ හැකි බැවින් වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර, එම උපකරණ ඒ සඳහා ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර ඇත. |

5.7 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

5.7.1 පළාත් සභා (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර) ආයතනවල කාර්ය මණ්ඩලය

--------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | --------------------------------- |
| (අ) | විධිමත් ස්ථාන මාරුවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමුපකාර දෙපාර්තමේන්තුවේ සමුපකාර පරීක්ෂක නිලධාරීන් ඇතුළු නිලධාරීන් 56 දෙනෙකු වසර 06 සිට වසර 30 දක්වා කාලයක් කුලියාපිටිය සහකාර කොමසාරිස් කාර්යාලයට අනුයුක්තව සේවය කරමින් තිබුණි. | විධිමත් ස්ථානමාරුවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ප්‍රදේශයේ ජීවත්වන අනිකුත් නිලධාරීන්ටද එම කාර්යාලවල සේවය කිරීමට අවස්ථාව සලසා දිය යුතුවේ. | සමුපකාර සමිති පරීක්ෂක නිලධාරීන්ට කොට්ඨාශයෙන් පිටතට මාරුවීම් ලබා නොදුන්නද විගණනය කරන සමුපකාර සමිති වාර්ෂිකව වෙනස් කර ඔවුන්ගේ සේවය ලබා ගන්නා බව කාරුණිකව දන්වමි. |
| (ආ) | වයඹ පළාත් සභාවේ පුරප්පාඩු වූ අනුමත තනතුරු 14 ක රාජකාරි ඉටුකිරීම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමික නිලධාරීන් 36 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටිවලට අනුකූලව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු කළ යුතුවේ. | බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් සුදුසුකම්වලට අනුව සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත විශ්‍රාමිකයින් බඳවා ගැනීමට සිදු වේ. |

5.7.2 අධ්‍යාපන කාර්ය මණ්ඩලය

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | --------------------------------- |
| (අ) | කලාප කාර්යාල 05 ක ගුරුභවතුන් 24 දෙනෙකුගේ පත්වීම් විවිධ හේතුමත ස්ථිර කර නොතිබුණු අතර, ඇතැම් ගුරුභවතුන්ගේ පත්වීම් සඳහා වර්ෂ 28 ක් පමණ | මානව සම්පත් කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව සිදු කිරීමට අවධානය යොමු කල යුතුවේ. | (i) ගිරිඋල්ල කලාප කාර්යාලයේ නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව සොයා ගැනීමට අපොහොසත් වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගතවී ඇතත් ස්ථිර කිරීම් සිදුව නොතිබුණි. | | (ii) මහව, කුලියාපිටිය සහ නිකවැරටිය කලාප කාර්යාල වලින් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛයේ 3.2 ඡේදය අනුව වඩාත් පහසු පාසල් වර්ගයට අයත් පාසලක උපරිම සේවා කාලය අවුරුදු 06 ක් වශයෙන් දක්වා තිබුණද අධ්‍යාපන කලාප 04 ක එකම පාසලේ අවුරුදු 07 සිට අවුරුදු 34 ක් දක්වා සේවයේ නිරතව සිටින ගුරුභවතුන් 1475 දෙනෙකු සිටින බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුවේ. | (i) ගිරිඋල්ල කලාප කාර්යාලයේ ගුරුභවතුන් 32 දෙනෙකු මාරු කර ඇති අතර, 65 දෙනෙකු වයස 55 ඉක්මවා ඇති බැවින් චක්‍රලේඛය පරිදි කටයුතු කර ඇත. 201 දෙනෙකු ඉදිරි වර්ෂවල ස්ථාන මාරු සිදුකිරීමට අපේක්ෂා කරමි.<br>(ii) මහව, කුලියාපිටිය සහ නිකවැරටිය කලාප කාර්යාල වලින් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 2.5.1 වගන්තිය අනුව රජයේ සේවයේ තනතුරක් දරන නිලධාරියෙකු වෙනත් සේවයකට අවුරුදු 02 කට වැඩි කාලයකට මුදා නොහැරිය යුතු වුවත්, වයඹ පළාතේ අධ්‍යාපන කලාප 04 කට අදාල ගුරුභවතුන් 24 ක් ත්‍රිවිධ හමුදාවේ ස්වේච්ඡා බලකායන්හි සක්‍රීය සේවය සඳහා මුදා හැර වර්ෂ 02 ක කාලය අවසන්ව තිබියදී නැවත ගුරු සේවයට වාර්තා කර නොතිබුණි. තවද 1993 වර්ෂයේ සිට 2019 දක්වා මෙම ගුරුභවතුන් 24 සඳහා එකතුව රු. 61,136,131 ක වැටුප් වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 2.5.1 වගන්තිය අනුව කටයුතු කල යුතුවේ. | (i) ගිරිඋල්ල කලාප කාර්යාලයේ අදාල බලධාරීන් දැනුවත් කර ඇති අතර, ඔවුන්ගේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරමි. තිදෙනෙකුගේ වැටුප් ප්‍රතිපූර්ණය සිදුවන බව දන්වමි.<br>(ii) මහව, නිකවැරටිය සහ කුලියාපිටිය කලාප කාර්යාල වලින් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | වයඹ පළාතේ අධ්‍යාපන කලාප 08 ක ගුරුභවතුන් 449 ක් ගුරු උපදේශකවරුන් ලෙස අනුයුක්ත කිරීම හේතුවෙන් පාසල්වල අදාල විෂයයන් සඳහා පුරප්පාඩු ඇතිව තිබූ නමුත් අදාල පාසල්වල ස්ථිර කාර්ය මණ්ඩලයට මෙම තනතුරු අයත් වන බැවින් පුරප්පාඩු | ගුරු උපදේශක පත්වීම් විධිමත් පත්වීමක් නොවන බැවින් පාසල්වල ඉගෙනුම් කටයුතුවලට බාධාවක් නොවන පරිදි කටයුතු කළ යුතුවේ. | විගණනය ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව පිළිගනිමි. කෙසේ නමුත් ගුරු උපදේශකවරුන්ගේ පත්කිරීම් හා ස්ථානගත කිරීම් සිදුකරනු ලබන්නේ පළාත් දෙපාර්තමේන්තුව මඟිනි. මොවුන්ගේ සේවාව කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමත නොවන නිසා අනුයුක්ත කිරීමක් පමණක් |

| | | | |
|---|---|---|---|
| | පිරවීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. | | සිදුකරනු ලබන අතර ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථානය පාසල බවත් දන්වමි. |

5.8 ප්‍රසම්පාදනය
--------------

5.8.1 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | --------------------------------- |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) පිළියෙල කළ යුතු අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු දැක්වෙන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වසර 03 ක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා පසුගිය වර්ෂවල සිට මේ දක්වා ප්‍රසම්පාදන සැලැස්ම එක් වර්ෂයකට පමණක් සකස් කල අතර, ඉදිරියේදී වර්ෂ 03 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන බවට කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) ප්‍රකාරව පිළියෙල කළයුතු ප්‍රසම්පාදන සැලැස්ම ගිරිඋල්ල, කුලියාපිටිය, නිකවැරටිය, සහ මහව කලාප අධ්‍යාපන කාර්යාල විසින් 2018 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) අනුව කටයුතු කල යුතුවේ. | ගිරිඋල්ල කලාප කාර්යාලය විසින් ප්‍රසම්පාදන සැලැස්ම 2019 වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු කර ඇත.<br><br>මහව, නිකවැරටිය සහ කුලියාපිටිය කලාප කාර්යාල වලින් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සැපයුම් හා සේවා සඳහා රු.13,000,000 ක් වෙන්කර තිබුණද, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද සියළුම ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |

5.8.2 වැඩ සැපයීම් හා සේවා
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | ------------------------------- |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 හා BIDDING Document I.T.B Clause 31 කොන්ත්‍රාත් කොන්දේසි 4.4 අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කලහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම | ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 5.4.8 BIDDING Document I.T.B. Claus 31 කොන්ත්‍රාත් කොන්දේසි | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |

| | | | |
|---|---|---|---|
| | සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 5 නොඅඩු මුදලක කාර්ය සාධන සුරක්ෂණයක් පවත්වාගෙන යා යුතු වුවද කුරුණෑගල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය කාර්යසාධන සුරක්ෂණයන් දීර්ඝ නොකර කොන්ත්‍රාත්කරුවන් 9ක ගේ කොන්ත්‍රාත්කාලය දීර්ඝ කර තිබුණි. | 4.4 අනුව කටයුතු කල යුතුවේ. | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 හා 2016 පෙබරවාරි 16 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/PMD/CLA/02/VOI.ii දරන ලිපිය අනුව ගිරි/වෙන්නෝරුව මහා විද්‍යාලයේ තාක්ෂණික ගොඩනැගිල්ල ඉදිකිරීම හා කු/ශාන්ත ආනා මහා විද්‍යාලයේ පරිගණක ඒකකය සහිත සිව්මහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම යන කොන්ත්‍රාත්තුවල මුදලින් සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකි වුවද එම ප්‍රමාණය ඉක්මවා සියයට 30 ක අත්තිකාරම් වශයෙන් පිළිවෙලින් රු.5,185,275 ක හා රු.5,900,097 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 හා අංක PFD/PMD/CLA/02/VoI.ii හා 2016 පෙබරවාරි 16 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කල යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 වගන්තියට පටහැනිව පාසැල් 05 ක කොන්ත්‍රාත් ගෙවීම් වලදී රු.5,783,934 ක රඳවුම් මුදල් තබා ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 වගන්තිය අනුව කටයුතු කල යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |

6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
------------------------------------

6.1 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ
-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 16 දින පවත්වන ලද පළාත් ගිණුම් කාරක සභාවේ තීරණය පරිදි රු. 1,480,000 ක මුදලක් වයඹ කර්මාන්ත සේවා කාර්යංශයේ වගකිව යුතු නිලධාරීන්ගෙන් මාස තුනක් ඇතුලත අයකළ යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් අදාල සැපයුම්කරු වෙතින් පමණක් මුදල් අයකර තිබීම නිසා රු. 231,667 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. | ගිණුම්කාරක සභාවේ නියෝගයට අනුකූලව කටයුතු කල යුතු වේ. | යම් ප්‍රමාදයක් සිදුවී ඇති බව පිළිගනිමි. ප්‍රමාදයට හේතුව විශාල මුදලක් ඉතා කෙටි කාලයකින් ගෙවා නිම කළ නොහැකි වීමකි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ප්‍රධාන අත්තිකාරම් කටයුත්තක් ලෙස විස්කම් නිවස පවත්වාගෙන යාම සඳහා වසර ගණනාවකට පෙර ලබාදී තිබුණු රු. 7,038,211 ක අත්තිකාරම් මුදල නිරවුල් නොවූ වැය ශේෂ ලෙස සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ඉදිරියට ගෙන එන ලද ශේෂයක් ලෙස පැවතුණි. | රු. 7,038,211 ක් වූ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට හෝ භාණ්ඩාගාර ගිණුම්වල දැක්වෙන මෙම ශේෂ පොතෙන් අත්හැර දැමීමට හෝ කටයුතු කල යුතුවේ. | අදාල වර්ෂවල ලැබුණු සියළු අක්මුදල් අමාත්‍යාංශයේ පොදු මුදල් පොතෙන් වැය කර සමස්ථ ශේෂය පියවා ඇති බැවින් මුදලින් පියවීම සඳහා මුදල් ශේෂ නොමැති බව සඳහන් කරමි. 1993 දී සිදු වූ ගනුදෙනු සම්බන්ධ වාර්තා සටහන් මේ වන විට සොයා ගත නොහැකි අතර, මෙහිදී මූල්‍ය අවභාවිතයක් හෝ වෙනත් මූල්‍යමය වැරදි සිදුව නොමැති බැවින් භාණ්ඩාගාරයට අදාල වාර්තා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. |
| (ඇ) | 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලසීමාව තුලදී ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදුවී තිබුණු රු. 13,609,655 ක මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම වටිනාකම අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | මූල්‍ය අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ගෙන් රු. 13,609,655 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මෙම කලාප කාර්යාලයේ සිදුව ඇති රු. 13,609,655 ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මේ වන විට ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් පරීක්ෂණ කටයුතු සිදුකර ඉදිරි කටයුතු ඉටුකිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ලබා දී ඇත. |
| (ඈ) | 2010 ඔක්තෝබර් 11 දිනැති 01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූල නොවන පරිදි කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි පළාත් පාලන ආයතන 04 ක් විසින් 2012 අගෝස්තු 07 සිට 16 දින දක්වා වියට්නාම සංචාරය සඳහා සභා අරමුදලින් වැය කර ඇති රු. 566,673 ක මුදල අය කිරීමට 2018 සැප්තැම්බර් 27 දින පැවති පළාත් අරමුදල් ගිණුම්කාරක සභාවේදී ලබාදි තිබූ උපදෙස් 2019 මැයි 10 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි. | ගිණුම්කාරක සභා නිර්දේශ අදාළ නිලධාරීන් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව පරිපාලන පියවරයන් ගත යුතුවේ. | 2019.04.04 දින වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම වියට්නාම් සංචාරය පිළිබඳව සාකච්ඡා කර ඇත. එහිදී මෙම සංචාරය සඳහා සහභාගී වූ සභාපතිවරුන් සහ නිලධාරීන් විසින් වැඩිපුර ලබා ගෙන ඇති මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කරන ලෙස දන්වා තිබුණද මෙතෙක් මුදල් ආපසු ගෙවීමක් සිදු කර නොමැති බව වැඩිදුරටත් සඳහන් කරමි. |

6.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජිත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට අදාලව වයඹ පළාත් සභාව විසින් විධිමත් සැලැස්මක් සකස් කර නොතිබුණු අතර 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී තිරසාර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |